**මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2021**

---

මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග, මාර්ග සංවර්ධන සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම සහ ඌව පළාත්වල කිලෝමීටර් 62.06 ක් වූ ජාතික මාර්ග සහ කිලෝමීටර් 2.25 ක් වූ පළාත් මාර්ග ඇතුළු ව කිලෝමීටර් 64.31 ක් වූ මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම සහ පාලම් 13 ක් ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු.මිලියන 12,674.90 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 100 ක් වන අතර ඉන් රු.මිලියන 10,774.74 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 85 ක් චීන අපනයන ආනයන බැංකුව විසින් ලබා දීමට එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 1,900.16 ක වටිනාකම ශ්‍රී ලංකා රජය මඟින් අරමුදල් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 නොවැම්බර් 29 දින ආරම්භ කරන ලද අතර 2020 නොවැම්බර් 28 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය නිම කිරීමේ දිනය 2022 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර ඇත.

## 1.3 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ යනාදී මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වැරදි ලෙස නිරූපණය කිරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 05 අනුව, 2019, 2020 සහ 2021 වර්ෂයන් සඳහා මහා භාණ්ඩාගාරය විසින් කරන ලද විනිමය ගැලපීම් රුපියල් මිලියන 600 ක් 2021 දෙසැම්බර් 31 දින දක්වා මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | අදහස් දක්වා නැත | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 05 අනුව විනිමය ගැලපීම් ගැලපුම් කළ යුතුය |

## 2.2 නීතී රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීතී රීති සහ රෙගුලාසි වලට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 උප වගන්තිය | චක්‍රලේඛයේ දක්වා ඇති උපදෙස් ප්‍රකාර ව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | 2021 වසරේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය පැතිරීම පාලනය කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද රෙගුලාසි හේතුවෙන් ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් භෞතිකව පැවැත්වීමට නොහැකි විය. | අවම වශයෙන් මාස දෙකකට වරක් ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම පැවැත්විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

## 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| 2020 නොවැම්බර් 28 දින වන විට ව්‍යාපෘතිය නිම කිරීමට ආරම්භයේ දී බලාපොරොත්තු වූ අතර 2022 සැප්තැම්බර් 30 දින දක්වා කාලය දීර්ඝ කරන ලදී. කෙසේ වුව ද, 2021 දෙසැම්බර් 31 දින වන විට භෞතික ප්‍රගතියෙන් සියයට 93 ක් සහ මූල්‍ය ප්‍රගතියෙන් සියයට 86.09 ක් ව්‍යාපෘතිය ලබා කරගෙන ඇත. | එකඟ වී නැත. ව්‍යාපෘතිය 2020 නොවැම්බර් 04 වැනි දින අවසන් කිරීමට නියමිතව තිබුණද, 2019 පාස්කු ප්‍රහාරය, COVID 19 වසංගතය, අයහපත් කාලගුණික තත්ත්වයන්, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදය, ප්‍රදේශයේ නාය යෑම් වැනි පවතින තත්ත්වයන් හේතුවෙන් කොන්ත්‍රාත්කරුට සැලසුම් කළ වැඩසටහනට අනුව වැඩ නිම කිරීමට නොහැකි විය. ඒ අනුව, 2022 අගෝස්තු 31 දක්වා කාලය දීර්ඝ කිරීම අනුමත කර ඇත. | අනවශ්‍ය වියදම් වළක්වා ගැනීම සඳහා මුල් සැලසුමට අනුව ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය |